සිතේ කුතුහලය දැනවීමක් සිදු වෙයි. කතාව පුරාම මෙබඳු සිදුවීම් හා අවස්ථා එකිනෙකට බද්ධ වන සේ ගොතා ඉදිරිපත් කරන්නට කතුවරිය පෑ දක්ෂතාව වැදගත් ලක්ෂණයකි. දිගින් වැඩි කෘතියක් වුවද පාඨකයාට වෙහෙසකින් හා නීරස බවකින් තොරව මෙම නවකතාව කියවාගෙන යාමට හැකි වනු ඇතැයි ද කිව හැකිය.

නවකතාවක යොදා ගනු ලබන අවස්ථා හා සිද්ධි මෙන්ම චරිත ද මැනවින් නිරූපණය කොට තිබීම එම කෘතියෙහි සාර්ථක බවට හේතු වෙයි. මෙම කෘතියෙහි ඇතුළත් වන ඇතැම් ඛේදජනක හා බිහිසුණු දර්ශන ද කතුවරිය සිය රචනා විලාසය යෝග්‍ය ලෙස මෙහෙයවමින් ප්‍රාණවත් ලෙස ඉදිරිපත් කර ඇත.

"නිවස තුළට වැදුණු ගයනි තම යහනට ගොස් මුණි න් අතට වැටී හඬන්නට පටන්ගත් අතර ඇයට තම අතීතය, වර්තමානය හා අනාගතය යන තුන් කලම පිළිබඳව දැඩි ශෝකයක් හා පසුතැවීමක් ඇති වී තිබුණි. ඉකි ගසමින් හැඬූ ගයනි මඳ වෙලාවකින් නින්දට වැටුණාය. එහෙත් අඩ නින්දෙන් පසු වූ ඇයට දොරේ අගුල් කැරකෙන හඬක් ඇසුණු අතර වහා අවදි වී ඇහුම්කන් දීගෙන සිටියාය. කිසිවකු හෝ නිවස තුළට ඇතුල් වී ඇත. මෙට්ටය යට සඟවා තිබූ කිනිස්ස අතට ගත් ගයනි හඬ නොනැගෙන සේ දුව ගොස් කාමරයේ දොරට මුවා විය. ඇගේ හදවත ගැහෙන්නට විය ------- ඇය තම ජීවිතය ගැන හටගත් විශාල බියකින් ගැහෙන්නට වූවාය." 321 පිට

නවකතාවක් කියවාගෙන යන පාඨකයාට එහි අන්තර්ගත චරිත හා පසුබිම් තුළ තමන් ද සැබවින්ම ජීවත් වන බව හැඟෙන සේ රචනා කළ හැකි වීම ලේඛකයකු හා ලේඛිකාවක සතු දක්ෂතාවකි. එමගින් පාඨකයා සහෘදයන් බවට පත් කරවමින් කතා පුවත ඉදිරිපත් කිරීමටත්, අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමටත් සාහිත්‍ය කරුවකු සමත් වනු ඇත.

'සජ්ඣායනා' නවකතාව මගින් සමන්තා විජේසිංහ මහත්මිය සමකාලීන සමාජය තුළ සිදු වෙමින් පවතින විවිධ වූත් විෂම වූත් තොරතුරු මොනවට පැහැදිලි කර දෙයි. යෞවන යෞවනයන් මෙන්ම විවාහ දිවියට එළඹී සිටින්නන් ද විවිධාකාර පෞද්ගලික ප්‍රශ්නවලට මුහුණ දෙමින්, ඒවායින් බැට කමින් දිවි ගෙවන අයුරු මෙම කෘතිය පාඨක අපට පෙන්වා දෙයි. රට තුළ දිගින් දිගටම සිදු වන අයහපත් ක්‍රියා විවිධ තරාතිරමේ පුද්ගලයන් කොතරම් පීඩනයකට පත් කරමින් තිබේද යන්න මෙම නවකතාව මගින් කෙරෙන සමාජ විවරණයයි. විටෙක පුරුෂ පක්ෂයේ ඇත්තන්ගේ දුර්ගුණ මෙන්ම කාමුක බව ද නිසා අසරණ කාන්තාවන් විපතට පත් වන ආකාරය සැබවින්ම සංවේදී ලෙසින් මෙම කෘතිය මගින් නිරූපණය වෙයි. සමාජයක උද්ගත වෙමින් පවතින විෂමාචාර, පුද්ගලයන්ට මෙන්ම පොදුවේ පවුල් ඒකක කෙරෙහි ද දැඩි ලෙස බලපාන ආකාරය පිළිබඳ හොඳ විමසුමක් මෙම කතුවරිය අතින් සිදු වී ඇත.

සිය ආදරය හා සෙනෙහස නොමඳව ලබන තම දූ පුතුන් සමාජයට පිවිසීමේදී ඊට වඩා හාත්පසින් වෙනස් වූ තත්වයන්ට මුහුණ දීමට සිදුවීම නිසා ශෝකජනක ඉරණමකට මුහුණ දෙනු බලා දුක දරාගත නොහැකිව කම්පා වෙමින් ජීවත් වන මව්පියන්, වැඩිහිටියන් මෙම නවකතාව තුළින් ඉදිරිපත් කිරීමට කතුවරිය යොමු වී තිබේ. පවුල නමැති සමාජ ඒකකය තුළ විවාහ බන්ධනය අසාර්ථක ප්‍රතිඵල ගෙන දෙවන අවස්ථා ඇති අතර මවකට එය දරාගත නොහැකිව ඇය පවසන ශෝකජනක වදන් කතු-වරිය පළ කර ඇත්තේ පාඨක සිත් තුළ ද සංවේදී හැඟීම් මතු කර ලමිනි. චරිත අතර සිදු වන ප්‍රබල සංවාද මගින් මෙම ලේඛිකාව එම පරමාර්ථය ඉටු කරගෙන ඇත.

"කොයි දේකටවත් කලබල වෙන්න එපා දුව. කසාද කඩාගන්න එක මහ දෙයක් නෙවි. කසාදෙ රැකගන්න එකයි අමාරු. මගෙ පුතා ඉවසන්න ------ " 47 පිට

සිය දියණියගේ අසාර්ථක විවාහ ජීවිතයත්, එහි ප්‍රතිඵල වශයෙන් දියණිය විඳින දුක් වේදනාත් දැඩි සිතින් දරාගනිමින් දියණියට අවවාද දෙන මෙම මාතෘ චරිතය එක් අතකින් පාඨක හදවත් තුළ අනුවේදනීය හැඟීම් මතු- කරලයි. අනික් අතින් බලන විට කතුවරිය තම කෘතිය මගින් සමාජය වෙත ගෙන හැර දක්වන පණිවුඩය ද මෙහි ඇතුළත් බව පෙනේ.

සාහිත්‍යය වූ කලී රස ජනනය කරන අතරම එමගින් සමාජ විවරණයක් ද සිදු වෙයි. අවසානයේදී රසික සිත්වලට යහගුණයක් මෙන්ම ආදර්ශවත් පණිවුඩයක් ද, ගෙන ඒමට සාහිත්‍ය නිර්මාණයක් සමත් විය යුතුය යන්න 'සජ්ඣායනා' නවකතාව මගින් සමන්තා විජේසිංහ සාක්ෂාත් කොට ගෙන ඇත.


MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au



IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community
We are proud to have lead the way for others to follow...
Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters
- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals
General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas
A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070
LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST
FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory
10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041
Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670
info@fairfieldslawyers.com

We Deliver Results...